රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 08/2014

මගේ අංකය :EST-7/TPORT/05/3521
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2014.12.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>ජාතික රක්ෂණ භාරකාර අරමුදල යටතේ රජයේ වාහන රක්ෂණය කිරීම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2007.12.18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/427, 2008.03.13 දිනැති PF/427 (1) සහ "රාජ්‍ය ආයතන සඳහා සාමාන්‍ය රක්ෂණ ආවරණයන් සැලසීම" යන මැයෙන් නිකුත් කරන ලද 2009.09.18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/437 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛ මගින් සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලට තම ආයතනික අවශ්‍යතා අනුව මෝටර් රථ රක්ෂණය ජාතික රක්ෂණ භාර අරමුදල හෝ සීමාසහිත රක්ෂණ සංස්ථාව මගින් කළයුතු බවට උපදෙස් ලබා දී ඇත.

03. එසේ වුවත් ඇතැම් රාජ්‍ය ආයතන තම ආයතනවලට අයත් මෝටර් රථ ඉහත උපදෙස් පරිදි රක්ෂණය කර නොගැනීම නිසා හදිසි අනතුරුවල දී වන්දිය ප්‍රතිපූර්ණය කර ගැනීමේ දී ගැටලු මතුවන බව නිරීක්ෂණය වේ.

04. එබැවින් ඉහත පළමුවන ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් චක්‍රලේඛයන්හි විධිවිධාන අනුව ඔබ ආයතනයට අයත් මෝටර් රථ රක්ෂණය කර ගැනීමට පියවර ගන්නා මෙන් දන්වා සිටින අතර මේ පිළිබඳව වැඩිදුර පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/437 හි 06 ඡේදයේ විධිවිධාන පරිදි රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විමසන මෙන් ද වැඩිදුරටත් දන්වා සිටිමි.

05. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව මත නිකුත් කරන ලදී.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය